# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

## 9 ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය කාලය :පැය 02යි

නම.......................................................................................................................................................

**1 කොටස**

* සැලකිය යුතුයි :
* 01 සිට 20 දක්වා සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

* 1-2 දක්වා ප්‍රශ්නවල දී ඇති උද්ධෘත පාඨයට ගැළපෙන සාම්ප්‍රදායික යෙදුම යටින් ඉරක් අඳින්න.

01) " මැණියෙනි, මම ඔබ ශ්‍රී පාදයට කැඳවාගෙන යමි" මේ ප්‍රකාශය තුළින් මවගේ ගුණවත්කම බාල දරුවාට පිහිටා ඇති බව පැහැදිලි වේ.
1. ඉහේ මලක් පිපුණා වගේ
2. උණ පුරුකේ දැම්මත් බලු වලිගයේ ඇද නැරේ
3. ගල හොඳ නම් අඹරන කහ මක්වේද ?
4. උගුරට හොරා බේත් කැවා වගේ

02) "පුතේ මම බෙරේ කරේ දාගෙන හැතැප්ම ගණන් පයින් ගිය කෙනෙක්" කියමින් පණිභාරතයන් ගෝලයින් දිරිමත් කළේ එතුමා තුළ වූ ගුණයක් ඉස්මතු කරමිනි.
1. උත්සාහවන්තයා ජය ගනී
2. පයබරවායට පිටිකර බෙහෙත් බැන්දා වගෙයි
3. ඉවසීමෙන් සැනසීම ලැබේ
4. ඇවිද්ද පය දහස් වටී.

03) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පිළිතුර තෝරන්න.
1. විශිෂ්ය 2. විශිෂ්ට 3. ශිෂ්ඨාචාරය 4. අළස

04) සිංහල අක්ෂර මාලාවේ "ත, ථ, ද, ධ, න" යනු
1. දන්තජ අක්ෂර වේ 2. ඕෂ්ඨජ අක්ෂර වේ 3. මූර්ධජ අක්ෂර වේ 4. තාලුජ අක්ෂර වේ.

05) "තාරුකී" යන පදයේ නිවැරදි ස්වර හා ව්‍යඤ්ජන වෙන් කිරීම වන්නේ ,
1. ත්+තා+ර්+උ+ක්+ඊ 2. ත්+ආ+ර්+උ+ක්+ඊ 3. ත්+ත්+ආ+රු+ක්+ඉ 4. ත්+ආ+ර්+රු+ක්+ඊ

06) සාහිත්‍යයේ බෙදීම් අතරට අයත් නොවන පිළිතුර වන්නේ ,
1 .ගද්‍ය 2. පද්‍ය 3. චම්පු 4. ව්‍යාකරණ

07) පහත පද අතරින් අතීත කාල ක්‍රියා පදයක් වන්නේ ,
1. වැටුණී 2. කැඩෙයි 3. නටන්නී 4. කැඩෙති

08) වෙස්සන්තර ජාතකය තුළ අප මහා බෝසතාණන් වහන්සේගේ චරිතය වන්නේ,
1. සාලිය කුමරු 2. ජූජක බමුණා 3. මන්ද්‍රි දේවිය 4. වෙස්සන්තර රජු

09) පූර්ව ක්‍රියා පද දෙකක් එකතු වී සැකසී ඇති යුගල පදයක් වන්නේ ,
1. ඇඳපැළඳ 2. වතුපිටි 3. කැවිලිපෙවිලි 4. හරකාබාන

10) ළමා කැල පේළියට ගමන් .......................
1. කරයි 2. කරති 3. කරහි 4. කළේ ය .

11) “මව්පියන් විසින් දරුවෝ රකිනු ලැබෙති” යන්නේ කර්තෘ කාරක වාක්‍යය වන්නේ ,
1. මව්පියෝ දරුවෝ රකිති.
2. මව්පියන් දරුවෝ රකිති
3. මව්පියෝ දරුවන් රකිති.
4. මව්පියෝ දරුවන් රැකෙති.

12) හීන්සැරය, මඟුල්කෑම, හත්පණ නම් වූ ප්‍රකට ළමා ගද්‍ය සාහිත්‍යය කෘති රචනා කළේ
1. කුමාරතුංග මුනිදාස මහතා ය
2. එස් . මහින්ද හිමි ය..
3. තොටගමුවේ ශ්‍රී රාහුල හිමි ය.
4. සීබල් වෙත්තසිංහ මිය ය.

13) හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අදින්න.
ආරාධිත අමුත්තෝ ....................... ( ප්‍රධාන /ප්‍රදාන ) ශාලාවේ අසුන් ගත්හ .

14) අනුක්ත බහුවචන පද දෙකක් හා උක්ත බහුවචන පද දෙකක් සහිත පිළිතුර වන්නේ ,
1. ළමයි, දරුවන්, ගුරුවරු, බල්ලෝ
2. ගොවීහු, සිසුහු, උගතුන්, ඔවුහු
3. අපි, ඔවුන්, තොපි, ගොවීන්
4. දරුවන්, මව්වරු, ළමයා , පූසන්

15) විරුද්ධාර්ථ පදයක් ඇතුළත් නොවන පිළිතුර වන්නේ
1. ඌන-අනූන
2. ඉඳහිට-නිතර
3. උඩුකුරු - යටිකුරු
4. වතු-පිටි

16) “සිංහල භාෂා දිනය, හා නර්තන දිනය” ලෙස සැලකෙන්නේ ,
1. මාර්තු 02 හා පෙබරවාරි 24 ය.
2. පෙබරවාරි 22 මාර්තු 02. ය
3. මාර්තු 24 හා පෙබරවාරි 02 ය
4. පෙබරවාරි 02 හා මාර්තු 24 ය

17.) “සුබස” යනු
1. සඟරාවකි
2. පුවත්පතකි
3. සංවිධානයකි,
4. ළමා පොතකි.

18) ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය වන්නේ ,
1. අයෙක් නැටීමට දක්ෂ විය.
2. ක්‍රීඩා කණ්ඩායමෙන් එක් අයෙක් ඉවත් වෙයි.
3. පුතණුවෝ දෙගුරුන් පා වැන්දේ ය
4. සියොත් කැල අහසේ පියාඹන්නේ ය.

19) සමහරෙක් මිහිරි හඬින් ගී ..................
1. ගයයි
2. ගයති
3. ගයන්නේ ය.
4. ගයති

20) “අශ්වයා වේගයෙන් රණ බිමට පැමිණියේ ය.” මෙහි අශ්වයාට සමාන පදයක් වන්නේ
1 ගජ
2. තුරඟ
3. ශක්‍රයා
4. සහසැස්

(ලකුණු 2 ×20=40)

## 11 කොටස

- උපදෙස් : මෙම කොටසේ 01 සහ 02 ප්‍රශ්න අනිවාර්ය වේ. 03, 04, 05, 06 07 ප්‍රශ්නවලින් 03ක් තෝරාගෙන ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.

01) පෙළ පොතේ ප්‍රායෝගික අභ්‍යාසවලට ඇතුළත් වන කවි පන්ති නිර්මාණය කර පොතක් සැකසීමට ඔබ කණ්ඩායමට ලැබුණි. ඒ ඇසුරෙන් පිළිතුරු සපයන්න.

I. කවිපොත සඳහා ඔබ යෙදූ මාතෘකාව කුමක්ද ? (ලකුණු 02)

II. ඔබේ කණ්ඩායමේ යහළුවන් කවි පන්ති සඳහා යොදාගත් තේමා තුනක් ලියන්න. (ලකුණු 03)

III. කවි පොත සකස් කිරීමට ගුරුවරයාගෙන් ලැබුණු උපදෙස් තුනක් ලියන්න. (ලකුණු 03)

IV. පොත් පිංච නිර්මාණය කිරීමේ දී ඔබ කණ්ඩායම මුහුණ දුන් ගැටලු දෙකක් ලියන්න .( ලකුණු 02)

V. කවි ලිවීමේ දී යොදාගන්නා ආකෘති දෙකක් නම් කරන්න. (ලකුණු 04)

VI. කවි එකතුවෙන් ඔබ දියුණු කරගත් කුසලතා දෙකක් ලියන්න. (ලකුණු 04)

(ලකුණු 16)

02) පහත දැක්වෙන මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 200කට නොඅඩු රචනයක් ලියන්න.

අ) ජංගම දූරකථනය අද සියලු දෙනාටම නැතිවම බැරි මෙවලමකි. නමුත් ළමා පරපුර අතර ජංගම දූරකථන පත්වීම ව්‍යසන රාශියකට හේතුවක් ව ඇත. ‘‘ජංගම දූරකථනය හා ළමා පරපුර ’’ යන මැයෙන් රචනාවක් ලියන්න.

ආ) තරගකාරී අධ්‍යාපන රටාව තුළ එකිනෙකා පරදා යන හැඟීම විනා සාමූහිකත්වයට දරුවන් යොමු කිරීමක් සිදු නොවේ. මෙය අනාගත හෙට දවස ගැන ඇති කරන්නේ බියකරු ස්වභාවයකි. ‘‘තරගකාරී අධ්‍යාපන රටාව හා අනාගත පරපුර ’’ යන මැයෙන් රචනාවක් ලියන්න.

ඇ) ජන කවි යනු සුන්දර සාහිත්‍යාංගයකි. එය අදට ද මිනිස් හැඟිම්වලට කතා කරන මාධ්‍යයකි. ‘‘ජනකවිය හා අපේ අතීතය’’ යන මැයෙන් රචනාවක් ලියන්න.

ඉ) වැඩිහිටියන්ගේ ජීවන අත්දැකීම් අපගේ ජීවිත හැඩ ගස්වා ගැනීමට මනා පිටුබලයක් සපයයි. ‘‘වැඩිහිටියන්ට සලකමු’’ යන මැයෙන් රචනාවක් ලියන්න.

ඊ) අලි ගම් වැදීම හේතුවෙන් මිනිස් ජීවිත විනාශවනවා සේම අලි මරාදැමීම නිසා ඔවුන් වඳ වීමේ අවධානමක් ද ලංකාව තුළ උද්ගතව ඇත. ‘‘ අලිමිනිස් ගැටුම අවම කරමු’’ යන මැයෙන් රචනාවක් ලියන්න. ( ලකුණු 14 )

03) ඔබ පාසලේ පැවැත්වෙන ‘‘සිසු අභිමන්’’ ත්‍යාග ප්‍රදානෝත්සවයට දෙමාපියන්ට ආරාධනා කරමින් විදුහල්පතිවරයා විසින් යැවෙන ආරාධනා පත්‍රය සකස් කරන්න. ( ලකුණු 10)

04) පහත සඳහන් ප්‍රකාශය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

‘‘ඉදින් මේ සිටු පුත්‍රයාණෝත් රා සොඬහු නම් අපට මහා සැපය. උනුත් රා සොඬ කරම්හ’’ යි සිතූහ.

I. මේ ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම කුමක්ද ?

II. එය උපුටාගත් මුල් ග්‍රන්ථය කුමක්ද ?

III. එම ග්‍රන්ථය ලියූ කතුවරයා කවුද ?

IV. මෙසේ සිතුවේ කවුරුන් ද ?

V. මුල් ග්‍රන්ථයේ රචනා ශෛලිය කුමක්ද ? (ලකුණු 2 ×5=10)

05) පහත සඳහන් කවි කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

බන්දා විජය දද අකනිට පද නිම්මේ
සින්දා හළ එතෙක් රුපු සිරිලක් අම්මේ
අන්දා ඔබගේ සිතියම හද මිණි බැම්මේ
වැන්දා මෙන්න මුදුනත් නගමින් දැම්මේ

කරුණා මහිම කොයි තරම ද කිවොත් ඔබේ
මැවුණා මහා ගංගාවල් ලෙසින් ඉබේ
ඉනුණා බසින දියරක් තැවරුණොත් මොබේ
මරණාසන්න හුස්මට මුත් ආසි ලැබේ

I. කවියා ඔබගේ සිතියම අදිනා බව පවසන්නේ කොහිද ?
II. ඉබේ මහා ගංගාවල් ලෙසින් මැවී ඇත්තේ කුමක්ද ?
III. මෙම පද්‍ය මගින් කියවෙන්නේ කුමක් ගැනද ?
IV. මරණාසන්න හුස්මට ආසිරි ලැබෙන්නේ කුමකින් ද ?
V. පහත සඳහන් වචනවල අර්ථ ලියන්න

අ) දද ආ) රුපු (ල:2× 5=10)

06) පහත සඳහන් වාක්‍යවල හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.

I. (කාන්තාවක්/කාන්තාවක/ කාන්තාවෝ ) .................මල් ප්‍රදර්ශනය නැරඹීමට පැමිණියහ.
II. ඒ තෙමේ දක්ෂ ලෙස ....................... ( නටයි /නටති / නටහු )
III. මිනිස්සු .............................( කුරුල්ලෝ /කුරුල්ලන් /කුරුල්ලනි ) වනයට මුදා හරිති .
IV. (සිසුහු /සිසුන්/ සිසුවා ) ..............................ගුරුතුමාට ආචාර කළහ .
V. එක් අයෙක් ගීත ගායනා .............................(කරති /කළෝය ./ කරයි ) (ල: 2× 5=10)

07. පහත සඳහන් වාක්‍ය නිවැරදි කර නැවත ලියන්න.

I. කොක් රංචුව පියඹා ගියේ ය .
II. තරු පෙළ අහස එළිය කරති.
III. සඟ ගණ පිඬුසිඟා වඩියි.
IV. ඕ තොමෝ සභාව ඇමතූහ.
V. ගස් පෙළ සුළඟට සෙළවෙති. ( ල: 2 × 5 =10)

***